**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - පළාත් සංරචකය - 2014**

**------------------------------------------------------------------------**

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2640 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ (iv) ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, පළාත් සභා හා ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු පළාත ඇතුළත හා උතුරු පළාත සහ දකුණු පළාත අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,530.8 කට සමාන එජඩො මිලියන 27.16 ක් වන අතර ඉන් රු.මිලියන 3,172 කට සමාන එජඩො මිලියන 24.4 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ඔක්තෝබර් 22 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිමකිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වර්ධනය කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2 මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

-----------------------------

මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කරන ලද අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|
| | | | **2014 වර්ෂය තුළ** | **2014 දෙසැම්බර් 31 දක්වා** | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 24.40 | 3,172.00 | 358.97 | 16.02 | 2,082.97 |
| ශ්‍රී ලං ර | 2.76 | 358.80 | 40.47 | 1.86 | 242.47 |
| එකතුව | 27.16 | 3530.80 | 399.44 | 17.88 | 2,325.44 |

3.2 භෞතික ප්‍රගතිය

---------------------

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, උතුරු පළාතේ තෝරාගත් පාලම් පුනරුත්ථාපනය හෝ ආදේශ කිරීම ඇතුළත්ව වවුනියා හා මන්නාරම දිස්ත්‍රික්කවල පළාත් මාර්ග කිලෝමීටර 140 ක් පමණ පුනරුත්ථාපනය කිරීම සහ පරිපාලන ගොඩනැඟිලි පුනරුත්ථාපනය කිරීම යන කොටස් දෙකක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වේ. එබැවින් ව්‍යාපෘතිය විසින් උතුරු පළාතේ වවුනියා හා මන්නාරම දිස්ත්‍රික්කවල මාර්ග 26 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැඟිලි 02 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 07 ක් ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත් පැකේජවල භෞතික ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා 2011 පෙබරවාරි මාසයේදී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ 06 කින් කොන්ත්‍රාත් පැකේජ 05 ක් මාස 11 සිට මාස 22 ක ප්‍රමාදයන් සහිතව 2014 වර්ෂයේදී නිම කර තිබුණි.

(ආ) රු.මිලියන 369 ක පිරිවැයකට කිලෝමීටර 26.9 ක දිගින් යුත් වෙප්පන්කුලම - පෙරියමුරිප්පු මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව, ආසියානු සංවර්ධන බැංකුවේ සහ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනයේ අනුමැතිය නොමැතිව පසුව නවතා දමා තිබුණි. කොන්ත්‍රාත්තුව නවතා දමන අවස්ථාව වන විට රු.මිලියන 448 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. පසුව තරඟකාරී ලංසු පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු තෝරාගෙන තිබූ අතර රු.මිලියන 499 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ඉතිරි වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

(ඇ) පරිපාලන ගොඩනැඟිලි 02 ක පුනරුත්ථාපන වැඩ සිදුකිරීම සඳහා 2014 ජුනි මාසයේදී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව 2014 දෙසැම්බර් 31 දිනට සියයට 63 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

3.3 පරිබාහිර කාර්යයන්

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.851,800 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පරිගණක හා උපාංග පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට භාරදී තිබූ අතර, ව්‍යාපෘතියේ කාර්යයන් වලට අදාළ නොවන කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ කටයුතුවලට අදාළ නොවන පළාත් සභා අමාත්‍යාංශයට අයත් කාර්යයන් විස්තර කෙරෙන වීඩියෝ වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.300,000 ක මුදලක් වැයකර තිබුණි.